ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2022-09-08

පැමිණිලිකරු : ආර්.පී.බී.බන්දුල තිලකසිරි මයා
අංක 37/1 කුරුඳුහින්න,
කෑගල්ල.

වගඋත්තරකරුවන් : 01. ලේකම්,
කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය,
II අදියර, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව,
04 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

03. අධ්‍යක්ෂ ජනරාල්(හිටපු)
ආර්.ඒ.කේ.රණවක මයා,
C/51, කැප්පෙටිපොළ මාවත,
කොළඹ 05.

<u>පැමිණිලි අංකය : එච්.ආර්.සී./2964/15</u>

පැමිණිලිකරුගේ පැමිණිල්ලේ සඳහන් කරුණු අනුව වගඋත්තරකරුවන් කැඳවා කරන ලද පරීක්ෂණ කටයුතු වලින් අනතුරුව පහත සඳහන් අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

පැමිණිලිකරු ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස ස්ථිර සේවයේ යෙදී සිටි නිලධාරියෙකු වන අතර රජයේ අවශ්‍යතාවය මත 2008.02.11 දින සිට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ



ප්‍රධාන කාර්යාලය } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. සභාපති } ෆැක්ස් } ඊමේල් }

ජනරාල් තනතුරට පත්කළ බව දක්වා ඇත. 2014 වසර දක්වාම එම තනතුර පූර්ණ කාලීනව පැමිණිලිකරු නිසි ලෙස රාජකාරි කටයුතු සිදුකරමින් සිටියදී මෙම අධිකාරිය 2014.01.03 දින සිට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස නම්කළ බවද එදින සිට තවදුරටත් මාස 03ක් පමණ කාලයක් එම තනතුරෙහිම සේවය කළ බව පෙන්වා දී ඇත. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පරිපාලන කටයුතු සිදුකර ගැනීම සඳහා කලාප 06කට වෙන්කර ගැසට්කළ පසු එහි කලාප අංක 01 යටතේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු ලෙස පැමිණිලිකරු සේවය කළ බව දක්වා ඇත. එම තනතුර ආයතන ප්‍රධානියෙකුගේ තත්වයේ තනතුරක් බවද ඊට අමතරව මෙම දෙපාර්තමේන්තුවේ වැඩබලන ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අධ්‍යක්ෂ ලෙසද පැමිණිලිකරු පත්කර තිබූ බව පෙන්වා දී ඇත.

2014.02.24 දින වන විට එවකට කටයුතු කළ විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් මත අමාත්‍යාංශ ලේකම් විසින් කලාප අහෝසි කරන බවට දන්වා සිටි පසු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරද අහෝසි වූ බව දන්වන ලදි. ඉනු පසුව අමාත්‍යතුමා සහ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත අභියාචනයක් යොමුකළ බවද ඒ අනුව ඒ කලාප භාරව කටයුතු කළ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් හට සේවා ස්ථාන නැවත ලබාදීම සිදුකළ යුතු අතර පැමිණිලිකරු හටද මෙම අමාත්‍යාංශය යටතේම පිහිටි සහාධිපත්‍ය කළමණාකරණ අධිකාරියේ සහකාර සාමාන්‍යාධිකාරි (නීති) තනතුර 2015.03.16 වන දින සිට ලද බවද එය මෙම දිනසිට මාස 06කට ද්විතියික පදනම මත සේවා නියුක්තියක් ලෙස ලබාදුන් බවද කියාසිටී. 2015.03.30 දින සිට මෙම තනතුරට අනුයුක්තව රාජකාරි කටයුතු කරමින් සිටියදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ රාජකාරි පිළිබඳ ප්‍රශ්න කිරීමට නීතිවිරෝධීව දේශපාලනමය මත පිහිටුවා තිබූ දූෂණ විරෝධී කමිටුව හා FCID ආයතනය විසින් සිදුකළ අදාල පැමිණිල්ලේදී අත්අඩංගුවට ගත් පිරිස අතරට පැමිණිකරුද අයිතිව ඇති අතර එය 2015.04.22 වන දින සිදුවී ඇති බව පෙනී යයි.

ඇපමත නිදහස්ව පැමිණ වෛද්‍ය උපදෙස් අනුව විවේක නිවාඩු 2015.09.19 වන දින දක්වා ලබාගත් බවද එම දින වන විට සයමාසික සේවා කාලය සහාධිපත්‍ය කළමණාකරණ සේවාධිකාරයෙන් අවසන් වූ පසු නැවත දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයට යායුතුව තිබූ නමුත් එසේ කළ ඉල්ලීමට සුදුසු තනතුරකට පැමිණිකරු පත් නොකළ බව පෙන්වා දෙන ලදි.

දිවිනැගුම දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් 2013.12.31 දින සිට තමා සේවය කළ HM-2-1 මට්ටමේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරින්ද ඉල්ලා අස්වූ පසු දිවිනැගුම දෙපාර්තමේන්තුවේ සුදුසු තනතුරක් සඳහා අන්තර්ග්‍රහණය කර විධිමත් පත්වීමක් ලබා නොදීමෙන් තම මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කළ බව දක්වා තිබේ.

එම අවස්ථාව වන විට තමා අන්තර්ග්‍රහණය කළ හැකි අධ්‍යක්ෂ ජනරාල් තනතුර හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 07ක් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර තිබූ බවද පැමිණිලිකරු පෙන්වා දී තිබේ.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම:**

වගඋත්තරකරුවන් විසින් තම කරුණු දැක්වීම ලිඛිතව ලබාදී ඇති අතර එය අංක DDD/HO/AD/LEGAL/HRC/2964/2015 හා 2015.09.30 දින යටතේ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වැ.බ සිටි ධම්මික ගුණවර්ධන මහතා විසින් යොමුකර ඇත. එහි පහත කරුණු සවිස්තරාත්මකව දක්වා ඇත.

01. පැමිණිලිකරු 1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරි පනතේ 3 (1) හා 3 (2) වගන්ති අනුව එවකට තිබූ ජාතිය ගොඩනැගීමේ හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ගරු අමාත්‍යතුමා වශයෙන් අතිගරු

ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල යටතේ 2008.02.11 වන දින සිට අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත්කළ බව පිළිගෙන තිබේ. පැමිණිලිකරු 2008.02.12 දින මෙම තනතුරේ වැඩභාරගත් බවද ඊට පෙර වෘත්තීය පුහුණු අධිකාරියේ ස්ථිර සේවකයෙකු ලෙස අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ කටයුතු කළ බවද එවකට ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ 2008.12.19 දිනැති MNB and EID/4/1/CMA/SAMU දරණ ලිපිය මඟින් හා ඉන්පසුව අවස්ථා කිහිපයකදී වෘත්තීය පුහුණු අධිකාරියේ සේවයෙන් නිදහස් කරගන්නා ලද අයෙකු බව පිළිගෙන ඇත.

02. පැමිණිලිකරුගේ සහ ඉහත කී අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම්වලට අනුව පැමිණිලිකරු වෘත්තීය පුහුණු අධිකාරියෙන් අවස්ථා කිහිපයකදීම නිදහස් කළ බවද 2014 වසර දක්වාම පැමිණිලිකරු සමෘද්ධි අධිකාරියේ සේවය කළ බවද දක්වා තිබේ. එම කාලය තුළදී ඔහුට හිමි HM-2-1 වැටුප සමෘද්ධි අධිකාරිය විසින් ද ගෙවා ඇති බව දක්වා ඇත.

03. 2013 අංක 01 දරණ දිවිනැගුම පනත අනුව 2014.01.03 දින සිට එම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන අතර 1995 අංක 30 දරණ පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය එතැන් සිට අහෝසි වේ. ඒ අනුව පැමිණිලිකරුගේ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ තිබූ අධ්‍යක්ෂ ජනරාල් තනතුර ද 2014.01.02 දිනෙන් අවසන් වූ බව දක්වා ඇත.

04. 2013.12.02 දිනැති ලිපිය මඟින් පැමිණිලිකරු වෘත්තීය පුහුණු අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස්වූ බවද, 2013.12.24 වන දින දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරගන්නා ලෙස ඉල්ලූ බවද ඒ අනුව පැමිණිලිකරු දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2014.01.03 වන දින සිට මෙම දෙපාර්තමේන්තුව නිල වශයෙන් පිහිටවූ 2014.04.28 දින දක්වා අධ්‍යක්ෂ ජනරාල් ලෙසද ඉන්පසු කලාප අංක 01හි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ලෙසද පත්කළ බව දක්වා තිබේ. එයට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියද ලැබී ඇත. තවද, MED/AD/දිවිනැගුම දෙපාර්තමේන්තුව අංක දරණ 2014.01.06 වන දිනැති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය මඟින් දක්වා ඇත්තේ දිවිනැගුම දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කිරීමට පියවර ගන්නා තෙක් ඊට අන්තර්ග්‍රහණය වූ අධිකාරිවල සේවය කළ නිලධාරීන් තමා දැරූ තනතුරුවල එකී රාජකාරි කටයුතු කරන ලෙසයි. එසේම පැමිණිලිකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමක් ද සිදුකර නොමැති බැවින් මෙම නිලධාරියා ඉහත ලිපියට අනුව රාජකාරි කටයුතුවල නිරත වී ඇති බව දක්වා ඇත. එහිදී සේවක අර්ථසාධක අරමුදල යටතේ අදාල HM-2-1 වැටුප් පියවර දිගටම ගෙවා ඇත.

05. තවද පැමිණිලිකරු 2014.05.20 වන දින සිට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය තනතුරට පත්කළ බව වගඋත්තරකරු දක්වා ඇත.

06. 2015.02.24 දිනැති නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශ ලේකම්ගේ DDD/HO/2/ADMIN/03 දරන ලිපිය මඟින් කලාප භාර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ධුරය 2015.02.28 දින සිට අහෝසි කළ බවද තනතුරු අහෝසි කිරීමට පෙර කලාප අහෝසි කර තිබූ බවද දන්වා ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරද 2015.02.28 දින සිට අහෝසි කර ඇත්තේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට පෙර බව දන්වා ඇත.

07. 2015.01.27 වන දිනැතිව පැමිණිලිකරු විසින් දිවිනැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත හා නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකළ ඉල්ලීම අනුව 2015.03.16 දින සිට සභාධිපත්‍ය කළමණාකරණාධිකාරියේ සහකාර සාමාන්‍යාධිකාරි (නීති) තනතුරට පත්කර ඇත. එතෙක් දිවිනැගුම දෙපාර්තමේන්තුවේ රාජකාරි සිදුකර ඇත. එය ද්විතියික පදනම මත මාස 06කට අනුයුක්ත කර ඇති අතර ඒ අනුව නව අධිකාරියේ රාජකාරි භාරගෙන රාජකාරි කටයුතු කර ඇත. ඉන් අනතුරුව දිවිනැගුම දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කිරීමට අවස්ථාව ලබාදී නොමැති බව පෙනී යන ලදි.

**පරීක්ෂණයේදී අනාවරණය වූ කාරුණු:**

මෙම පැමිණිල්ලට අදාලව පරීක්ෂණ කටයුතු සඳහා වගඋත්තරකරුවන් කැඳවා ගැනීමට සිතාසි නිකුත් කළ අවස්ථා ගණන බොහෝ ප්‍රමාණයක් වුවද නිවැරදි වගඋත්තරකරුවන් හඳුනා ගැනීමට අපහසු වීමද දිවිනැගුම දෙපාර්තමේන්තුව විවිධ අවස්ථාවලදී වෙනත් අමාත්‍යාංශයක විෂය පථයට අයත් වීම හේතුවෙන් වගඋත්තරකරුවන් වෙනස් වීම මත කැඳවිය යුතු වගකිවයුතු වගඋත්තරකරුවන් හඳුනා ගැනීම අපහසු වී ඇත. එහෙත් අවස්ථා කිහිපයකදීම මෙම පැමිණිල්ල අදාල පාර්ශවකරුවන් කැඳවා විභාග කර ඇත.

නමුත් 2020.01.20 වන දින පරීක්ෂණ අවස්ථාවේදී දෙපාර්ශවය විසින් ඉදිරිපත් කළ යුතු කරුණු ඉදිරිපත් කළ පසු පැමිණිලකරු ඉල්ලා සිටි සහනය ලබාදීමට අදාලව කරුණු සලකා බලමින් සිටින බවට ප්‍රකාශ වීම මත සාධාරණ කාලයක් ඊට ලබාදීමට පාර්ශවකරුවන් එකහව ඇත. ඒ අනුව 2019.12.20 වන දිනැතිව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් මේ පිළිබඳව අදාල අමාත්‍යාංශය වෙත නිර්දේශ සහිතව ඉදිරිපත් කළ වාර්තාවේ පිටපතක් ඉදිරිපත් කර ඇත. පසුව වර්තමාන වන විට නැවත පැමිණිලිකරුට සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් ධූරය ලබාදීමෙන් අදාල සහනය ලබාදී ඇති බවද වාර්තා වී තිබේ. එහෙත් පැමිණිලිකරු වැඩිදුරටත් කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටියේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල් ධූරය කැබිනට් මණ්ඩලය මඟින් කොන්ත්‍රාත් පදනම මත ලබාදුන් පත්වීමක් බවත්, මේ දක්වා මෙම දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කිරීමක් සිදුවී නොමැති බවත් ය. ඒ අනුව 2014.01.03 දින සිට මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවය හා උසස්වීම් හා තනතුරට අදාල සියලුම වරප්‍රසාද තමාට හිමිව යුතු බවත්ය.

**නිරීක්ෂණ හා නිගමන:**

පැමිණිලිකරුට වර්තමානය වන විට අමාත්‍ය මණ්ඩලය මඟින් කොන්ත්‍රාත් පදනම මත තාවකාලිකව අධ්‍යක්ෂ ජනරාල් සමෘද්ධි දෙපාර්තමේන්තුව ලෙස අදාල සහනය ලබාදී තිබුණද දීර්ඝ කාලීනව මූලික අයිතිවාසිකම් කඩවීමකට ලක්වී ඇති බව පහත සඳහන් නිරීක්ෂණ අනුව නිගමනය කරමි.

2013 අංක 01 දරණ දිවිනැගුම පනත හා එක්ව කියවිය යුතු 2017 අංක 2 දරණ සංශෝධන පනතින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. පැමිණිලිකරු 2008 වසරේ සිට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේද පසුව එම අධිකාරිය අහෝසි වූ පසු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේද අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අදාලව ද අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරේද ඊට අමතරව අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය තනතුරේද වැඩ බලමින් හා සේවය කරමින් ස්ථිර තනතුරකට පත්ව කටයුතු කර ඇත.

2008.02.12 වන දින සිට පැමිණිලිකරු ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත්කර තිබී ඇත. රජයේ අවශ්‍යතාවය මත වෘත්තීය පුහුණු අධිකාරියෙන් නිදහස් වී අධ්‍යක්ෂ ජනරාල් ස්ථිර තනතුරට හිමි HM-2-1 වැටුප් පියවරේද වැටුප් දිගටම සමෘද්ධි අධිකාරියෙන් ලබා ඇත.

2013.01.08 වන දින සිට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ඇතුළු තවත් ආයතන 05ක් අන්තර්ග්‍රහණය කර දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ පනත සම්මත වී ඇත. 2014.01.03 වන දින සිට මෙම දෙපාර්තමේන්තුව බලාත්මක වී ඇත.

2013.12.31 වන දින සිට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් ඉවත්වීමටත් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සහ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සුදුසු තනතුරුවලට අන්තර්ග්‍රහණය වීමටත් කැමැත්ත 2013.12.24 හා 2014.01.17 දිනැතිව ලිඛිතව පළකර ලබාදී ඇත. සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවය ඊට ලැබී ඇත.

2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 44 (ඉ) වගන්තිය අනුව ඇත්තේ "නියමිත දිනට පෙරාතුවම වූදිනයේ එකී අධිකාරිවල සේවයේ නියුතු නිලධරයන්ගේ හෝ සේවකයන් අතුරින් යම් නිලධරයෙකු හෝ සේවකයෙකු දෙපාර්තමේන්තුවේ සේවයට අයදුම් කරන්නේ නම් එවැනි සේවකයින්ට දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයෙකු ලෙස අන්තර්ග්‍රහණය කළ යුතුය." ලෙසටය. ඒ අනුව පැමිණිලිකරු ද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවකයෙකු ලෙස කටයුතු කර ඇත. 2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 44 (ඉ) III වගන්තියට අනුව මෙම නිලධාරියා විසින් අදාල පෝර්ම ඉදිරිපත් කරමින් අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත. දිවිනැගුම පනතේ අරමුණු අනුව මෙම පැමිණිලිකරුට අන්තර්ග්‍රහණය වියහැකි SL-3 මට්ටමේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 07ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2014.03.31 වන දිනැතිව අනුමත කර ඇත. ඒ අනුව 2014.01.10 දිනැති ගැසට් පත්‍රයට අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කලාප 06ක් ඇතිකර ඇති අතර ඉන් අංක 01 කලාපයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ධූරයට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2014.03.24 දිනැතිව රාජකාරි පවරා ඇත. විධිමත් පත්වීමේ ලිපියක් ලබාදෙන බව සඳහන් වුවද එවැනි පත්වීම් ලිපියක් ලබාදී නොමැත.

2014 ජනවාරි මස සිට 2015 පෙබරවාරි මස දක්වාම අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය යටතේ HM-2-1 වැටුප් පරිමාණයෙන් වැටුප් ලබාගෙන ඇති අතර සේවා අංක 24803/B යටතේ සේවක අර්ථසාධක අරමුදල් ගෙවා ඇත්තේ ඉල්ලුම්කරු මෙම දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරියෙකු වූ නිසා බව පැහැදිලි වේ.

2014.01.03 වන දිනට පෙරද පසුවද දිවිනැගුම පනත අනුව අන්තර්ග්‍රහණය වීමට පැමිණිලිකරු ලිඛිතව ඉල්ලීම් කර ඇතත් විධිමත් පත්වීම් ලිපියක් හෝ අන්තර්ග්‍රහණ ලිපියක් පැමිණිලිකරු වෙතද ලබා දී නැති බවද නිරීක්ෂණය වේ.

2014.05.20 වන දින සිට පැමිණිලිකරු තම නිත්‍ය තනතුරට අමතරව වැඩබැලීමට පත්කළ අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය තනතුරේද රාජකාරි ඉටුකළ බව නිරීක්ෂණය වේ.

නිසිපරිදි රාජකාරි ඉටුකරමින් සිටියදී 2015.01.08 දින පැවති ජනාධිපතිවරණයෙන් පසු නව විෂයභාර අමාත්‍යවරයෙකු පත්ව ඇති අතර 2015.02.24 වන දින පැමිණිලිකරු දැරූ තනතුරුවලින් 2015.01.28 වන දින සිට ඉවත් කළ බව දක්වා ඇති බවද නිරීක්ෂණය වේ. 2015 පෙබරවාරි මස දක්වා පමණක් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සමඟින් පැමිණිලිකරුට හිමි HM-2-1 වැටුප් පියවරේ වැටුප් හා දීමනා ගෙවා ඇත. සාමාන්‍ය කම්කරු නීතියේ මූලධර්ම අනුව සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සහිතව රාජකාරි සිදුකරන නිලධාරියෙකුගේ සේවය අත්හිටුවීම, සේවයෙන් පහ කිරීම හෝ අවසන් කිරීමට අදාලව කටයුතු කිරීමක් සිදුනොවී ඇති බව නිරීක්ෂණය වේ. එමෙන්ම දිවිනැගුම පනතේ අදාල විධිවිධාන උල්ලංඝනය කරමින් මෙම නිලධාරියාගේ ඉල්ලීම් නොසලකා හරිමින් වගඋත්තරකරුවන් හා ඊට සම්බන්ධ නිලධාරින් දිගින් දිගටම කටයුතු කර ඇති බව අවධාරණය කරමි. පරිපාලන කලාප අහෝසි කිරීම නිසා එම රාජකාරි ඉටුකළ නිලධාරින් පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව ලබාදුන් උපදෙස් අනුව කටයුතු කර නොමැත.

නිලධාරිවරයා සහ අදාල සියලුදෙනා නිදොස්කොට නිදහස් කර ඇත. මෙම අසත්‍ය චෝදනා දේශපාලන පළිගැනීම් අරමුණින් සිදුකර ඇත.

මෙම පැමිණිලිකරු සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත්ව සිට සේවක අර්ථසාධක අරමුදල් සහිත වැටුප් ලැබූ රජයේ ස්ථිර තනතුරක් දැරූ නිලධාරියෙකි. විවිධ තනතුරු ගණනාවක විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු හා ආයතන ප්‍රධානී ලෙස කටයුතු කලද දිගටම මූලික අයිතිවාසිකම් කඩවීමේ තත්වයකට පත්ව සිටි බවද පැමිණිකරුට සමාන තත්වයේ සිටි අන්තර්ග්‍රහණය වූ ආයතනවල හා වෙනත් සේවාවලින් පැමිණි වෙනත් නිලධරයන් සුදුසු අවස්ථාවල මෙම දෙපාර්තමේන්තුවල සුදුසු තනතුරු වලට අන්තර්ග්‍රහණය කර ඇති බව හෝ පත්වීම් ලබාදී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරු දීර්ඝ කාලීනව දේශපාලනික හා පරිපාලනමය හේතු මත මූලික අයිතිවාසිකම් කඩවීමකට ලක්කර ඇති බවට කරුණු තහවුරු වන බව මින් නිගමනය කරමි.

පැමිණිලිකරු 2015 වසරේ සිට අඛණ්ඩවම මූලික අයිතිවාසිකම් කඩවීමකට ලක්ව ඇති අතර එයට දේශපාලනික හේතුන් හා පරිපාලනමය හේතු මූලික වී ඇති බව තහවුරු වේ. 2015.01.08 වන දින පැවති නව ජනාධිපතිවරණයෙන් පසු පත්වන රජයේ විෂයභාර අමාත්‍යවරයාගේ හා වගකිවයුතු නිලධාරින්ගේ පත්වීමත් සමඟ පැමිණිලිකරුට තම රැකියාව අහිමි වීමට කරුණු හේතු වී තිබේ. ඉන්පසුව පත්වූ නිලධාරීන් විසින් මෙම පැමිණිලිකරු හට හිමි ස්ථිර අන්තර්ග්‍රහණ පත්වීම් ලිපිය හෝ ස්ථිර රැකියාවද නැවත සේවය ලබාගැනීමට ඇති අවස්ථාද අහිමි කර ඇති බව නිගමනය කරමි.

**නිර්දේශය:**

1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IIIවන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමෙන් 2015 පෙබරවාරි මාසයේ සිට මේ දක්වා එම තනතුරු දැරූ වගඋත්තරකරුවන් විසින් පැමිණිලකරුගේ මූලික අයිතිවාසිකම් කඩකර ඇති බව මින් නිර්දේශ කරමි. ඒ අනුව පැමිණිලිකරුගේ ඉල්ලීම අනුව තමා සේවය කළ තනතුරට ලබාදිය යුතු 2014.01.03 දින සිට සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කර විධිමත් පත්වීම ලබාදී ස්ථිර තනතුර අහිමිකර තිබූ දින සිට හිමිවිය යුතු හිඟ වැටුප්, වැටුප් වර්ධක සහ වෙනත් වරප්‍රසාද දීමනා සමඟ හිමිකර දීමට වගඋත්තරකරුවන් විසින් පියවර ගතයුතු බව නිර්දේශ කරමි.

2022.10.10 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මින් නිර්දේශ කරනු ලැබේ.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,

සභාපති/හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම්...

ආචාර්ය විජිත නානායක්කාර,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

දි/-Lab